




# ඕළු පිපීලා !

හක් ගෙඩිය පිම්බේ කුඩා දරුවෙක් !

තම්මැට්ටම්, ගැටබෙර වාදනය කළේ තවත් කුඩා පිරිමි ළමයින් කීපදෙනෙක් ආරාධිතයින්ව දොරටුවේ ඉඳන් ආසනවලට කැඳවාගෙන ගියේ මේ පුංචි කණ්ඩායම.

ආරාධිතයින්ව අපි අඳුනාගත්තේ ඇඳුමේ ඉහළ කොටසේ පැළඳගන්න සේසතක් වගේ කුඩාවට කරල තිබුණ සැරසිල්ලෙන්.

ආරාධිතයින්ව පිළිගත්තේ බුලත් හුරුළු දීලා. බුලත් කොහෙන් හොයාගත්තද මන්දා. ඒ තරුණ දියණියන් ඇඳල හිටියේ උඩරට ඔසරිය. පුතාලා ඇඳලා හිටියේ සිංහල ජාතික ඇඳුම. අපේ ලොකු අයට ඉගෙන ගන්න දේවල් ගොඩයි.

පොල්තෙල් පහන පත්තු කරලා, විනාඩි දෙකක් නිහඬව ඉඳලා, පාසල් ගීය ගායනා කරලායි උත්සවය පටන් ගත්තෙ. ඒකට මඟුල් බෙර වාදනය කළෙත් අර පුංචි අෑයෝ.

මේ තමයි බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය පටන් ගන්න සුපුරුදු සම්ප්‍රදායික විදිය. මේ අවුරුද්දේ පාසැලේ විසි වෙනි සංවත්සරය සමරන්නත් එක්ක උත්සවය මහ ඉහළින් ම සංවිධානය කරලා. පින්සල තමන්ට දැණුන අදහස් එකතු කරලා සටහනක් තිබ්බා. පන්හිඳත් මොන මොනවාදෝ කුරුටු ගෑවා.

"පැමිණ සිටි සියළුදෙන පිළිගනිමින් කථාව පවත්වන ලද්දේ චන්ද්‍රසිරි මාපා මහත්මා විසිනි. වර්ෂ 1992 දී ගරු ගංගොඩවිල සෝම හිමිහන්ගේ සහ මිත්‍රසේන ගමගේ මහත්මාගේ මූලිකත්වයෙන් ඇරඹුන බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසැලේ දැනට උපදේශක තනතුර හොබවන ගරු දිගාමඩුල්ලේ විමලානන්ද හිමියන් විසින් අනුශාසනාව පවත්වන ලදී. අපේ දරුවන්ට අපේකම ලබාදීම අනිවාර්ය වියයුතු යැයි උන්වහන්සේගේ අනුශාසනාවේ අවධාරණය කෙරිණ. කෝවෙල් ප්‍රදේශය නියෙ-ජ්ජනය කරනා ෆෙඩරල් ආණ්ඩුවේ මන්ත්‍රීවරියක වන මාරියා වැම්වාතිනොව් (ඒරස් ඕපඩ්නසබදම) මහත්මිය ආරාධිත අමුත්තකු වශයෙන් සිය කථාව



**සිසිර දිසානායක**

ඇරඹූයේ ප්‍රදේශයේ මුල් උරුමක්කාරයින් වන ආදි වාසී ජන කොට්ඨාශය සිහිපත් කරමිනි. ශ්‍රී ලාංකික හැදියාවේ වර්ණවත් බවින් උද්දාමව හුන් ඇය ඉංග්‍රීසි භාෂාවට අමතරව තවත් භාෂාවන් හැදෑරීම කිසිවිටෙකවත් අවතක්සේරු නොකළ යුතු බව අවධාරණය කළාය." පන් උත්සවය ගැන ලිව්වෙ එහෙමයි.

ඒ කාලෙ මොනවහරි සිද්ධියක් වුණාම ඒ ප්‍රවෘත්තිය රටේ ඉන්න අනික් අය අතරට අරන්ගිය මාධ්‍යයක් තමයි කවි කොලය. කව්වලින් සිද්ධිය රසට ගොතල කොලවල මුද්‍රණය කරලා ප්‍රසිද්ධ තැන්වල විකුණුවා. ඒ විකිණුවේ ඒ කවි තාලෙට කිය කියා. අපේ පුංචි කාලෙ වෙනකොටත් කලාතුරකින් කවි කොල විකුණන අය දකින්න ලැබුණා. උත්සවේ කලා අංගවලට මුල අල්ලලා දුන්නෙ කවිකොල විකුණන කෙනෙකුගේ චරිතකුයි ඒකට එකතු වෙන ගමේ තවත් චරිතයකුයි එකතු වෙලා. මේ චරිතවලට ඇන්දේ සිංහල භාෂා පාසැලේ විදුහල්පති ජයන්ති වන්නිආරච්චි මහත්තයායි පුෂ්පකුමාර දිසානායක මහත්තයායි දෙන්නා. උන්නැහේලාට අපූරුවට රඟපාන්නයි, කවි කියන්නයි පුළුවන් බව දන්නෙ දැන්නෙ. කවි ලියවිල්ල දිගටම ලියාගෙන ගියා. පන් අනික් පැත්තෙන් සටහන් එකතු කළා.

ප්‍රසංගයේ කලාංග ආරම්භ කරන ලද්දේ පළමු වසරේ දැරියන්ගේ සරස්වතී පූජා නැටුමකිනි. නිතර ඇසීමට නොලැබෙන සරස්වතී ගීයක් තෝරාගැනීමත්, ඉතා ආකර්ශනීය ඇඳුමත් කුඩා දැරියන්ගේ නර්තන හැකියාවන් වඩා ඔප කිරීමට සමත් විය.

මින් පෙර වතාවල මෙන් වෙනම ම පිඨිකාවක් එක් එක් අංගය හඳුන්වාදෙන කුඩා නිවේදක නිවේදිකා-වන් වෙනුවෙන් ඉදි කර නොතිබුණ ද අංගයෙන් අංගයට තිරය වසන ලද නිසා තිරය ඉදිරිපස වේදිකා කොටස ඒ සඳහා යොදා ගැණින. එක් එක් අංග සඳහා ළමුන් සූදානම් කිරීමට මෙන්ම අතිරේක තාවකාලික පසුතල අංග සකස් කිරීම සඳහා තිරය අංගයෙන් අංගය වැසීමට හා විවෘත කිරීමට සිදු වන්නට ඇත.

"චූටි චූටි බෝනික්කෝ" ගීතයට සහ "ටක් ගානවා" ගීතයට බළාංශයේ ළමුන් ඉදිරිපත් කළ නර්තන සිත් ගන්නා සුළු සුරතල් අංග විය. සුනිල් එදිරිසිංහයන් ගයන "හංස රාජිනී" ගීතයට ඉදිරිපත් කළ භාරත නර්තනයන්, ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්නයන් ගේ නිර්මාණයකට අනුව නෙළු අධිකාරී ශිල්පිනිය ගැයූ "හංසා වන්නම"ට එක වසර සිසුවියන් ඉදිරිපත් කළ නර්තනයත්, වඩිග පටුන නර්තනයත් වඩාත් ශාස්ත්‍රීය මුහුණුවරක් ගත්තේය.

දෙක වසර සිසුන් ඉදිරිපත් කළ "අන්දරේ", පහ වසර සිසුන් ඉදිරිපත් කළ "ආඬි හත් දෙනාගේ සුප් හැලිය", හය වසර සිසුන් ඉදිරිපත් කළ "නුවණ සොයා යෑම", දෙක වසර සිසු-න් ඉදිරිපත් කළ "හොඳ ළමයින් වෙලා ඉමු", එක වසර සිසුන් ඉදිරිපත් කළ "අපි වෙමු අපි පුංචි ළමයි", හත වසර සිසුන් ඉදිරිපත් කළ "සිරි සඟ බෝ", තුන වසර සිසුන් ඉදිරිපත් කළ "අවිධිමත් ආචාර පෙළපාලිය", අට වසර සිසුන් ඉදිරිපත් කළ "අපූරු උපාය" වැනි අංගය එකි-නෙකට නොදෙවෙනි වූ සිත් ගත් අංගයන් විය.

"ආඬි හත් දෙනාගේ කැඳ හැලිය" වෙනුවට "ආඬි හත් දෙනාගේ සුප් හැලිය" නමින් වූ අංගය ඉදිරිපත් කළේ සබේ රාළ චරිතයක් මාර්ගයෙනි. එම අංගයට "අතුරු මිතුරු" ගීතය සඳහා කළ රංගනයක් ද අවසානයේ එක් විණ. මෙල්බර්න් නුවරින් ම නිර්මාණය වූ ළමා චිත්‍රපටයක මෙල්බර්න් නුවර ළමුන් පිරිසක්ම ගයමින් රඟ පෑ දර්ශන පෙළකට පසුබිම් වූ මෙම ළමා ගීය මෙල්බර්න් ළමා පරපුරට ම උරුම වී ඇති බව දැනෙනා විට නෙතු අගට කඳුලක් එක් විණ. මෙහිදී ඊට ගායනයෙන් එක් වුණු සිඩ්නි නුවර වාසී දරුවාව ද සිහිපත් කළ යුතු වෙයි.

එමෙන්ම එක වසර සිසුන් ඉදිරිපත් කළ "දොන් පිං පිං", හතර වසර සිසුන් ඉදිරිපත් කළ "ගුම් නාදය", නවය වසර සිසුන් ඉදිරිපත් කළ "කටට වැටක්", පහ වසර සිසුන් ඉදිරිපත් කළ "මතකයෙන් බිඳක්", හත වසර සිසුන් ඉදිරිපත් කළ "ගැමි සුවඳ", නවය වසර සිසුන් ඉදිරිපත් කළ "මධුර වසන්තේ" වැනි අංගද ප්‍රසංගය ඒකාකාරිත්වයෙන් මුදවමින් ඉදිරියට රැගෙන යාමට සමත් විය.

විස වසර සමරන අපේ පාසැල නමින් තුන වසරේ සිසුන් ඉදිරිපත් කළ අංගය පාසැලේ යටගියාව සිහිපත් කළා වූ අංගයක් විය. ප්‍රේක්ෂකාගාරයෙන් ද ඇතැම් චරිත වේදිකා-වට එක් වූයේ ඉදිරි පිය ගැට පෙළකිනි. " මතකයෙන් බිඳක්" අංගයට එක් වූයේ " කාලගෝල", "රතු හැට්ටකාරී", "තාරාවෝ ඉගිලෙති", " නෙයිනගෙ සූදුව", "මීපුර වැසියෝ", "රාජකපුරු" වැනි වේදිකා නාට්‍යවල ගී සඳහා කළ රඟපෑම් පෙළකි. ප්‍රසංගයේ වඩාත් ප්‍රශස්ත අංගය ලෙස මෙම අංගය නම් කළ හැකි වන්නේ ඒ රංගනයන්ට හා ගායනයන්ට දරු-වන්ව පුහුණු කරවා ගැනීමත්, ඇඳුම් නිර්මාණය කරගැනීමත් සුළු පටු සේ සිතිය නොහැකි නිසාවෙනි.

"නළමුදු සුවඳ" නර්තනය සඳහා අටවසර සිසුවියන් සැරසීගෙන සිටියේ ඔසරියෙනි. අඟ පසඟ පෙන්වමින් කරනා නර්තනයන්ට අතුල් පහරකි. භරත නර්තන ඇඳුම්වලින් හා සිංහල ඇඳුම්වලින් එල්ල කරන්නේ. ඔසරිය ඇඳගත් එකම උසින් යුත් දැරියන් පිරිසක් විසින් කළ නර්තනය කලාත්මක බවින් ද අනූන විය. හය වසර සිසුන් "සිරි සාර බුලත් විට" ගීතයට නර්තනයත්, ආදි සිසුන් " සුවඳ සිනා මල්" ගීතයට කළ නර්තනයන් එළෙදින්ම ඇගයිය යුතු තවත් අංග තදකක් විය. පන්හිඳ ඔය විදියට ලියාගෙන යන අවි අස්සේ පින්සලත් මේ විදියට ලිව්වා.

ප්‍රසංගයට ලොකුම ආලෝකය වුනේ වේදිකා සැරසිල්ල. අපේ සිංහල කලාවට ගැලපෙන්න චාම්වම සුදු පාටින් කරලා තිබුණ පසුතල නිර්මාණ හරිම අගෙයි. මේ කටයුතු කළේ චින්තක ලියරත්න මහත්තයා පූජා නැටුමට, හන්සා වන්නමට එහෙම හිස් පළඳනා කරලා තිබුනෙත් ඒ මහත්තයා. හංසා වන්නම හදපු හිස් පළඳනාවෙ කුඩාවට හංස හිසක් කැටයම් කරලා. හරිම කලාත්මකයි.

හැම අංගයකටම වගේ කරලා තිබුණ ඇඳුම් නිර්මාණ හරිම ලස්සනයි. ඒ වගේම කලාත්මකයි. කුඩා අයගේ නැටුම්වලට ගැලපෙන්න ඒ අංගවලට පාට පාට එකතු කරලා.

සමරු කලාපය ගැනත් කියන්න ඕන. සම්පත් විජේසිංහ ලක්ඛන ප්‍රනාන්දු, ධර්ම ශ්‍රී කුමාරපේලි මහත්තුරුයි මනෝරි බණ්ඩාරනායක නෝනයි තමා සමරු කළඹ නිර්මාණය කරල තියෙන්නෙ. චිත්‍ර අඳින් දරුවන්ටත් ඉඩක් සමරු කළඹේ වෙන් කරලා. ඒ අය "අතුරු මිතුරු" ප්‍රසංගයට ඇඳපු චිත්‍රවලින් පිටුවක් පුරවලා.

"මේ පාර ශබ්ද පරිපාලනය හොඳයි නේද ?" මෙච්චර වෙලා පන්ගෙයි පින්ගෙයි ලියවිලිවලට එබිකම් කර කර උන්නු පැන්සල ඇහුවා. "ඇත්තටම ලොකු වැඩ කොටසක් දසුන් ගජමන් උන්නැහේ කරලා තියෙනවා..." පැන් කිව්වා. විදුලි ආලෝකය දුන්න සරත් කුමාරසිරි මහත්තයයි හසිත ෆොන්සේකා මහත්තයයි දෙන්නත් කිසි හැල හැප්පීමක් නැතිව වැඩේ කරගෙන ගියා.

පන්හිඳ කිසි "හාවක් හුවක්" නැතිව දිගටම ලියාගෙන ගියා. පින්සලයි, පැන්සලයි පන්හිඳගෙ ලියවිල්ලට එබිකම් කළා.

සහතික පත්‍ර ප්‍රදානයේ දී ගුරු මණ්ඩලයේ ශාන්තා ගමගේ, චන්දි මාපා, දර්ශනී පෙරේරා, සොනාලි නානායක්කාර, රම්‍යා තිලකරත්න, ශ්‍රියාණි බමුණුසිංහ, ප්‍රසන්ත ද අල්විස්, ශ්‍රී පාලී හෙට්ටිආ-රච්චි, පුෂ්පිකා ගමගේ, කෙනත් පඬිකෝරාල යන මහත්ම මහත්මීන් ඇගයීමට ලක් වූයේ මේ වෙහෙ-සකර වූත් සුන්දරතම වූත් කාර්යය සඳහා පමණක් ම නොවේ. වසර පුරාවට ම ඔවුන් කරන කැපවීම ද වෙනුවෙනි. උත්සවයේ අවසන ජාතික ගී ගැයුමට පෙර ජයන්ති වන්නිආරච්චි විදුහල්පති වරයා ගේ ස්තූති කතාව හෘදයාංගම කථාවක් විය උත්සවාරම්භයේදී ශිල්ප දැක් වූ කුඩා සෝරී වාද්‍ය වෘන්දය දැක් වූ බෙර සන්ධ්වනිය පාසැලේ සියළු දරු දැරියන් ගුරුවර ගුරුවරියන් වේදිකාවට කැඳවූයේ ලෙය තුල මුහුකරවාගෙන ආ අපේ සංස්කෘතික උරුමයේ අභිමානය මොනවට විදහා දක්වමිනි.
මෙවර ප්‍රසංගයේ දක්නට ලැබුණු තවත් විශේෂත්වයක් වූයේ කුඩා පිරිමි ළමුන් නර්තනයට හා රංගනයට දැක් වූ හැකියාවයි. නර්තනයට හපන් පිරිමි දරුවකු ඉදිරිපත් කළ "ඕළු පිපිලා" ගීත ගායනය නොයෙකුත් වේදිකා සැරසිලි, රංගන, නර්තනවලින් සපිරි වේදිකාව සියතට ගෙන තමන් නතු කරගත්තේ ගායන කුසලතාවයෙන්මයි. "අතුරු මිතුරු" ළමා ප්‍රසංගය වෙනුවෙන් "දේදුන්නක පාට" ගීතය සඳහා නිර්මාණය කළ නර්තනය ඒ කුඩා දැරියන් විසින් එම ඇඳුමින්ම ඉදිරිපත් කරන ලදී.

පන්ට ලියවිල්ල ඉවර කරන්න නොදී කඳුලක් කොලයට පැන්නා. තෙත් වුණ කඩදාසියේ ආමරුවෙන් පන් නැවතිලි තිතක් කිව්වා.

එදා ඒ නැටුම ඉදිරිපත් කරපු දැරිවියෝ නැටුමෙන් පස්සේ පන් වාඩිවෙලා උන්නු තැනට ඇවිත් "පන් මාමේ" කිව්වා. පන්ට ඒක සම්මාන සීයකට වඩා වටිනවා.....
"අනේ දුවේ ඔයාලා ඔක්කොම අද හොඳට කළා." පන් ඒ දැරිවියන්ගේ හිස් පොඩි අත ගෑවා.
"ඇත්තෙන් ම ඔව්. හරි සතුටුයි ! Well Done !!


Do you need
Your Own Sri Lankan Accountant With
>> Personalized Advice at Any Time
>> Pre Agreed Fixed Fee & No More Surprises
>> Always Close to Your Business
Physically and in Mind
"We will take care of you"
Over 10 Years
Experienced Service For
> Individual and Business Tax Returns
> GST & BAS
> Bookkeeping Services (MYOB and QuickBook)
> Business Start Up Solutions (Incorporations & System Design)
> Software Training
> Small Business Advice and Training



Amali Liyanage
"Advance Tax & Business Consultant"
M.Com.B.Sc.ASA,
Registered Tax Agent
M : 0433 732 854
e : advanceab@gmail.com
1/98, Plumpton Av
Glenroy - 3046